# 2013 වර්ෂය සඳහා
# ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ
# කාර්ය සාධන වාර්තාව

ඩී. සී. ඒ. ගුණවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

# தொகைமதிப்பு புள்ளிவிபரத் திணைக்களத்தின்
# 2013 ஆம் ஆண்டுக்கான
# செயலாற்றுகை அறிக்கை

டி. சி. ஏ. குணவர்தன
பணிப்பாளர் நாயகம்

# PERFORMANCE REPORT
# OF THE
# DEPARTMENT OF CENSUS AND STATISTICS
# FOR THE YEAR 2013


**D. C. A. Gunawardena**
**DIRECTOR GENERAL**

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාන ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වන්නේ රජයට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාලේඛන රැස් කිරීම හා රජයේ වෙනත් ආයතන වලට මෙන්ම දත්ත භාවිතා කරන්නන්ට සංඛ්‍යාලේඛන දැනුම බෙදා හැරීමයි. මෙරට සමාජ ආර්ථික තත්වයන්ගේ විවිධ අංශයන්හි දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීමේ වගකීම ඇතුළුව සංඛ්‍යාන සේවයේ අවශ්‍ය වන්නා වූ රාජ්‍ය ආයතන සඳහා වෘත්තීය මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීමේ හා අනුයුක්ත කිරීමේ කටයුතු ද එයට පැවරී ඇත. එයට අමතරව සංඛ්‍යාන කටයුතු සඳහා සහාය අවශ්‍ය ආයතනයන් සඳහා සංඛ්‍යාන උපදේශන සේවාවන් ද එමඟින් ලබා දෙයි.

ගත වූ වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් භාරගත් බොහෝ කාර්යයන් ඉතාමත් සාර්ථක අයුරින් නිම කිරීමට හැකි වීම සතුටට කරුණකි.

ඉකුත් වර්ෂයෙහි ආරම්භ කළ කාර්යයන් තව දුරටත් අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට බලාපොරොත්තු වන අතරම 2013 වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව වෙහෙස නොබලා කටයුතු කල දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ස්තුතිය පිරිනමමි. එසේම දෙපාර්තමේන්තුවේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සහයෝගය දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන වෙත මෙන්ම මහජනතාව වෙතද මාගේ ස්තුතිය පිරිනමමි.



ඩී. සී. ඒ. ගුණවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
තැ.පෙ. 563
කොළඹ

දුරකථන අංකය : +94 11 2147001
ෆැක්ස් : +94 11 2147010
විද්‍යුත් ලිපිනය : dgcensus@sltnet.lk
වෙබ් අඩවිය : www.statistics.gov.lk

## පටුන


**1.** **හැඳින්වීම**

**2.** **දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්**

**2.1** **දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ**

2.1.1 ජන හා නිවාස සංගණනය - 2011/2012
2.1.2 ආර්ථික සංගණනය - 2013/2014
2.1.3 ගැටුම් හේතුවෙන් අවතැන් වූවන් පිළිබඳ සංගණනය - 2013
2.1.4 වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය
2.1.5 තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය
2.1.6 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2013
2.1.7 කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය
2.1.8 වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2013
2.1.9 ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය
2.1.10 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2012/2013

**2.2** **මෙරට සමාජ ආර්ථික තත්වයන් පිළිබඳ දත්ත එක්රැස්කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් කෙරුණ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු**

2.2.1 වී සංඛ්‍යාති
2.2.2 ආහාර ශේෂ පත්‍රය
2.2.3 ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන හා සත්ව සංඛ්‍යාති
2.2.4 ජාතික ගිණුම්
2.2.5 කොළඹ පාරිභෝගික මිල දර්ශකය - (පදනම 2006/07 = 100)
2.2.6 නිෂ්පාදක මිල දර්ශකය (PPI)
2.2.7 සිල්ලර හා නිෂ්පාදන මිල ගණන්
2.2.8 අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංඛ්‍යාති
2.2.9 පුහුණු කටයුතු
2.2.10 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු
2.2.11 ප්‍රකාශන කටයුතු
2.2.12 මුද්‍රණ කටයුතු
2.2.13 සිතියම් විද්‍යා කටයුතු
2.2.14 දත්ත ප්‍රචාරණය කිරීමේ කටයුතු
2.2.15 පුස්තකාලය
2.2.16 ක්ෂේත්‍ර කළමණාකරන කටයුතු

**2.3** **අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු**

2.3.1 වාර්ෂික රැකියා සමීක්ෂණය
2.3.2 සාමාන්‍ය ඉපයීම් සහ වැඩ කරන කාලය පිළිබඳ සමීක්ෂණය
2.3.3 අධ්‍යාපන සංඛ්‍යාති
2.3.4 වෛද්‍ය සංඛ්‍යාති

2.3.5 ජීව සංඛ්‍යාති
2.3.6 ධීවර සංඛ්‍යාති
2.3.7 අවම වැටුප් දර්ශකය
2.3.8 කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය - 2013
2.3.9 රේගු සංඛ්‍යාති

**3. පරිපාලනය**

**3.1 ප්‍රධාන අංශ, ශාඛා කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල**

3.1.1 අංශ සහ ඒකක
3.1.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල
3.1.3 දිස්ත්‍රික් කාර්යාල
3.1.4 පළාත් සභාවන්හි සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය

**3.2 කාර්ය මණ්ඩලය**

**3.3 සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගිවීම - 2013**

**3.4 උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම්**

**3.5 අභ්‍යන්තර විගණන කටයුතු**

**4. මුල්‍ය වාර්තාව - 2013**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2013

## 1. හැඳින්වීම

මෙරට සමාජ ආර්ථික තත්වයට අදාල දත්ත එක්රැස්කිරීම, සකස්කිරීම, විශ්ලේෂණය කිරීම හා බෙදාහැරීමේ වගකීම පැවරී ඇත්තේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට යි. ජාතික සැලසුම් හා රජයේ ප්‍රතිපත්ති සකස් කිරීම සහ එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය දත්ත සැපයීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකෙරේ. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ ඇතුලු විවිධ මාර්ග වලින් ලබා ගන්නා දත්ත අනුසාරයෙන් නොයෙකුත් විෂයයන් සම්බන්ධයෙන් නොකඩවා දත්ත සැපයීමෙන් දේශීය මෙන්ම විදේශීය සංවිධානවල දත්ත අවශ්‍යතා ද සපුරන ලදී. දෙපාර්තමේන්තුව විසින් රැස්කරනු ලබන දත්ත ජනගහනය, කෘෂිකර්මය, වෙළෙඳාම, කර්මාන්ත, මිල ගණන් හා ජාතික ආදායම් ආදී සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය කරයි.

**දැක්ම**

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුලින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

**මෙහෙවර**

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

## 2. දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්

දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන් පුළුල් වශයෙන් පහත දැක්වෙන කොටස් තුනට බෙදිය හැක.

2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

2.2 මෙරට සමාජ ආර්ථික තත්වයන් පිළිබඳ දත්ත එක්රැස්කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටු කෙරුණ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

2.3 ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

### 2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

### 2.1.1 ජන හා නිවාස සංගණනය - 2011/2012

2012 වර්ෂයේ සිදු කරන ලද අවසන් අදියරේ සංගණන තොරතුරු ලබා ගැනීම හා සංශෝධිත කටයුතු අවසන් වීමෙන් පසු සියළුම උපලේඛන පරීක්ෂා කිරීම හා පරිලෝකන කටයුතු අවසන් කර ඇත.

ඉන්පසු පරිලෝකනය කරන ලද දත්ත ගොනුවල දත්ත පරීක්ෂා කොට සංස්කරණ කටයුතු ද අවසන් කරන ලදී. සංස්කරණය කරන ලද දත්ත ගොනුවේ රැකියා, කර්මාන්ත හා වෘත්තීය සුදුසුකම් වලට අදාල කේත යෙදීම 50% ක ප්‍රමාණයක වැඩ අවසන් කර ඇත. 2011 ජන හා නිවාස සංගණනයට අදාල සියළුම ලැයිස්තුගත කිරීමේ ලේඛන (F1 ලේඛන) පරිලෝකනය කිරීමේ කටයුතු ද අවසන් කර ඇත.

උක්ත සංගණනයට අදාල 5% නියැදියේ දත්ත ගොනු භාවිතා කොට ජන හා නිවාස තොරතුරු වගු සකස් කර එම වගු වෙබ් අඩවියට නිකුත් කර ඇත. 5% නියැදියේ වාර්තාව සකස් වෙමින් පවතී.

### 2.1.2 ආර්ථික සංගණනය 2013/2014

**කර්මාන්ත සංගණනය**

ශ්‍රී ලංකාවේ දේශ සීමාව තුල පිහිටි කර්මාන්ත, වෙළඳ හා සේවා ඒකක ලැයිස්තු ගත කිරීම මේ වන විට අවසන් කර ඇත. සංගණන තොරතුරු ලබා ගැනීමේ අදියර මූලික කොට දත්ත භාවිතා කරන්නන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම, ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීම, මුදල් ඇස්තමේන්තු කාල රාමු පිළියෙල කිරීම, දත්ත වගු සඳහා ආකෘති සකස් කිරීම හා ආර්ථික සංගණනයේ කර්මාන්ත වෙළඳ හා සේවා අංශයේ ගණන් ගැනීමේ අදියර සඳහා ප්‍රශ්නාවලි සැකසීමට අදාලව මූලික ආකෘති සකස් කිරීමේ කටයුතු මෙම වසර තුළ නිම කොට ඇත.

**කෘෂිකර්ම සංගණනය**

ඉහත සංගණනයට අදාලව ශ්‍රී ලංකාවේ අක්කර 20 ට වැඩි වතු ලැයිස්තුව හා එය පදනම් කොට වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම මෙම වසර තුළ නිම කොට ඇති අතර සංගණන ප්‍රශ්ණාවලිය පරිලෝකනයට අවශ්‍ය පරිලෝකන යන්ත්‍ර මිලට ගැනීම හා පරිලෝකනය සඳහා අවශ්‍ය පරිලෝකන වැඩසටහන නිර්මාණය කිරීම සඳහා අදාල ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම මේ වනවිට නිමා කොට ඇත.

### 2.1.3 ගැටුම් හේතුවෙන් මිය ගිය/තුවාල ලැබූ පුද්ගලයින් හා දේපළ හානි පිළිබඳ සංගණනය 2013

මෙම සංගණනය 2013 වර්ෂය ආරම්භයේදී සැලසුම් කර නොතිබූ අතර පසු කාලීනව ජනාධිපති ලේකම් කාර්යාලය මගින් කරන ලද ඉල්ලීමකට අනුව පවත්වන ලදී.

රට තුළ සන්හින්දියාව ඇතිවන හා සාමය ගොඩනැගෙන යුගයක් පිළිබඳ ඉදිරි දැක්මක් නිර්මාණය කිරීමේ අරමුණින් පිහිටුවන ලද උගත් පාඩම් හා ප්‍රතිසන්දාන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ අනුව ශ්‍රී ලංකාව තුළ ඇවති අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් සිදුව ඇති හානි පිළිබඳව සංගණනයක් පවත්වා තොරතුරු රැස් කළ යුතු යැයි නිර්දේශ වී ඇති බැවින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව උක්ත සංගණනය පවත්වන ලදී. මෙම සංගණනයේ සියළුම තාක්ෂණික කටයුතු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අතර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවන ලදී. මෙම සියළු කාර්යයන් ජනාධිපති ලේකම් කාර්යාලය අනුබද්ධව පිහිටුවා ඇති ඒකකයක් මගින් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී.

මෙම සංගණනයේ සැලසුම් කටයුතු 2013 වර්ෂයේ පෙබරවාරි මස පමණ සිට ආරම්භ කරන ලද අතර නොවැම්බර් මස 25 දින සිට මසක පමණ කාලයක් තුළදී සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු (දත්ත එක් රැස් කිරීම) අවසන් කිරීමට හැකි විය. සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු අවසන් වූ පසු තොරතුරු රැස් කරන ලද උපලේඛන ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීම 2013.12.27 දින සිට ආරම්භ විය. දත්ත සංස්කරණ කටයුතු, උප ලේඛන පරිගණකගත කිරීම, මූලික වාර්තාව සහ අවසන් වාර්තාව සකස් කිරීම 2014 වස්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිතය.

### 2.1.4 වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය

වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණ කටයුතු වසරකට දෙවරක් සිදු කරන අතර 2012/13 මහ කන්නය හා 2013 යල කන්නය මෙම වර්ෂයට අයත් වේ. 2012/13 මහ කන්නයට අදාල දිස්ත්‍රික් වාර්තා ඇසුරින් අවසන් වාර්තාව පිළියෙල කොට වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීමත් 2013 යල කන්නයේ වී

අස්වැන්න පිළිබඳ තාවකාලික වාර්තාව පිළියෙල කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමත් මෙම වසර තුල නිම කොට ඇත.

### 2.1.5 තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය

2012/13 වර්ෂය සඳහා තේ, රබර් සහ පොල් වල නිෂ්පාදන වියදම් ඇස්තමේන්තු කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම ඒ ඒ ආයතන මාර්ගයෙන් සිදු කෙරේ. මෙම දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන නියැදියකට අනුව ලබා ගන්නා තොරතුරු අනුව අදාල ගණනය කිරීම් කරනු ලැබේ. තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම ගණනය කිරීමට අදාළ විස්තරාත්මක තොරතුරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් අංශයේ ලියාපදිංචි තේ කම්හල්වලින් ලබා ගන්නා අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් පවත්වන ලද සමීක්ෂණයක් පදනම් කොට රබර් සඳහා නිෂ්පාදන වියදම ගණනය කරනු ලැබේ. පොල් නිෂ්පාදන වියදම ගණනය කිරීමට අවශ්‍ය තොරතුරු ද ක්ෂේත්‍ර සමීක්ෂණයක් මඟින් රැස් කෙරේ. මේ වන විට සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලි ඒ ඒ ආයතන වලින් හා දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබෙමින් පවතී.

### 2.1.6 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2013

පතල් හා කැනීම්, නිෂ්පාදන, කර්මාන්ත, විදුලිය, ගෑස් සහ ජලජ නිෂ්පාදන හා බෙදා හැරීම යන ක්ෂේත්‍රයන්හි ආර්ථික ක්‍රියාකාරිත්වය මෙම සමීක්ෂණය මගින් ආවරණය කරනු ලබයි. මේ සඳහා සේවකයන් 25 දෙනෙක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ යොදවන සියළුම ආයතන තෝරා ගනු ලබන අතර සේවකයන් 5-24 දක්වා සේවයේ යොදවා ඇති ආයතන වලින් තෝරා ගත් නියැදියක් භාවිතා කරනු ලබයි.

2012 වර්ෂයේ සමීක්ෂණයට අදාලව දත්ත සංස්කරණය කිරීම, කේත කිරීම හා පරිගණකගත කිරීමත් මෙම වර්ෂයට අදාල ප්‍රශ්ණාවලිය හා උපදෙස් සකස් කර මුද්‍රණය කිරීම, නියැදිය තේරීම හා විශාල ආයතන වෙත ප්‍රශ්ණාවලිය ඇතුළු අනෙකුත් ලේඛන තැපැල් කිරීමේ කටයුතු නිම කොට ඇත.

### 2.1.7 කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛයිමාසික සමීක්ෂණය

කාර්මික නිෂ්පාදන ආයතනවල නිෂ්පාදන මට්ටම, අමු ද්‍රව්‍ය පරිභෝජනය, යෙදවුම්, ඉපයීම් හා සේවා නියුක්තිය පිළිබඳ කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා මෙම සමීක්ෂණය සැලසුම් කර ඇත. 2012 වර්ෂයේ අවසන් කාර්තුවේ ක්ෂේත්‍ර කටයුතු සිදු කොට වර්ධන අනුපාතිකය ගණනය කර අවශ්‍ය කටයුතු සඳහා ජාතික ගිණුම් අංශයට ලබා දීමත් සිදු කොට ඇත.

### 2.1.8 වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමික්ෂණය - 2013

1994 වර්ෂයේ සිට වාර්ෂිකව පවත්වාගෙන එනු ලබන මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ මූලික තොරතුරු සැපයීමයි. ICTAD ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛන ලබාගෙන නියැදිය තේරීම, ඉදිකිරීම් ආයතන සඳහා ප්‍රශ්ණාවලිය තැපැල් කිරීම හා ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීමත් සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලි ලැබෙන අනුපිළිවෙලට කේත කිරීම හා සංස්කරණ කටයුතු කිරීමත් සිදු කරන ලදී.

### 2.1.9 ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය, රැකියා නියුක්ති සහ රැකියා වියුක්ති මට්ටම් සහ ඒවායේ උපනති පිළිබඳ මැන බැලීම සඳහා ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය සැලසුම් කර ඇති අතර 1990 වර්ෂයේ පලමු කාර්තුවේ සිට නොකඩවා කාර්තු මට්ටමෙන් මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි. මෙහිදී කාර්තුමය ඇස්තමේන්තු ජාතික මට්ටමෙන්ද, වාර්ෂික ඇස්තමේන්තු දිස්ත්‍රික් මට්ටමෙන්ද ඉදිරිපත් කරනු ලබයි.

ජන හා නිවාස සංගණනය හේතුවෙන් 2012 වර්ෂය පලමු කාර්තුවේ සමීක්ෂණ කටයුතු සිදු නොකරන ලද අතර ඉතිරි කාර්තු තුනේ සමීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

**වගුව 1 : ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය 2012**

**සාරාංශ දර්ශක**

| දර්ශකය | ශ්‍රී ලංකාව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| ශ්‍රම බලකාය (වයස අවු :10 හා ඊට වැඩි ) ('000) | 8,465 | 5,637 | 2,828 |
| ශ්‍රම බල සහභාගීත්වතා අනුපාතිකය (%) | 47.2 | 66.8 | 29.9 |
| රැකියා නියුක්ත ජනගහනය ('000) | 8,129 | 5,477 | 2,652 |
| රැකියා නියුක්ත අනුපාතිකය (%) | 96.0 | 97.2 | 93.8 |
| රැකියා විරහිත ජනගහනය ('000) | 336 | 160 | 176 |
| විරැකියා අනුපාතිකය (%) | 4.0 | 2.8 | 6.2 |

මීට අමතරව 2013 වර්ෂයේ පලමු කාර්තුවට අදාල ඉංග්‍රීසි වාර්තාව වෙබ් අඩවියේ පලකොට ඇත.

### 2.1.10 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/2013

ජාතික ගෘහ ඒකක සමීක්ෂණ වැඩසටහන යටතේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය මෙම දෙපාර්තමේන්තුව මගින් වසර 3 කට වරක් පවත්වනු ලබයි. මෙම සමීක්ෂණ මාලාවේ 8 වන සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු 2012 ජුලි මාසයේ ආරම්භ වූ අතර 2013 ජුනි මාසයේ අවසන් විය.

එය මුළු දිවයිනම ආවරණය වන පරිදි මාසික වට 12 කින් පැවැත්විණි. තොරතුරු ලබා ගන්නා උපලේඛනය කාණ්ඩ 9 කින් සමන්විත වන අතර ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, පාසල් අධ්‍යාපනය, සෞඛ්‍යය, ගෘහ ඒකක ආදායම් හා වියදම්, ගෘහ ඒකකය සතුව ඇති කල් පවතින භාණ්ඩ, මූලික පහසුකම් ලබා ගැනීම, ගෘහ ඒකකයේ ණය ගැති භාවය, නිවාස හා සනීපාරක්ෂාව, ස්වාභාවික විපත්, ඉඩම් අයිතිය, සත්ව පාලනය යන ක්ෂේත්‍ර වලට අදාලව තොරතුරු රැස් කරන ලදී. මෙවර සමීක්ෂණයේ ලබා ගත් දත්ත අතර සමාජ ආරක්ෂණ දර්ශකය ගණනය කිරීම සඳහා අවශ්‍ය දත්තද ඇතුලත් කොට ඇත.

මෙම සමීක්ෂණයට අදාල මුල් මාස තුනේ දත්ත භාවිතා කරමින් පිලියෙල කරන ලද මූලික වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.

**වගුව 2 : ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/2013**

**සාරාංශ දර්ශක**

| දර්ශකය | ඒකකය | වටිනාකම |
|---|---|---|
| මාසික ගෘහ ඒකක මධ්‍යනය ආදායම | රු. | 46,207 |
| මාසික ගෘහ ඒකක මධ්‍යස්ථ ආදායම | රු. | 30,400 |
| මාසික ගෘහ ඒකක මධ්‍යනය ඒක පුද්ගල ආදායම | රු. | 11,932 |
| ආදායම් උපයන්නන්ගේ මාසික ගෘහ ඒකක මධ්‍යනය ආදායම | රු. | 25,778 |
| ගෘහ ඒකක ආදායම සඳහා ගිනි සංගුණකය | - | 0.48 |
| මාසික ගෘහ ඒකක මධ්‍යනය වියදම | රු. | 40,887 |
| ආහාර සංගණකය | %. | 39.4 |
| දරිද්‍රතා දර්ශකය | % | 6.50 |

## 2.2 මෙරට සමාජ ආර්ථික තත්වයන් පිළිබඳ දත්ත එක්රැස්කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් කෙරුණ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

### 2.2.1 වී සංඛ්‍යාති

දිවයින තුල පිහිටි සියලුම කුඹුරු බිම් ප්‍රමාණය ගණනය කිරීම සහ වාරි මාර්ග ක්‍රම අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් කුඹුරු බිම් ප්‍රමාණය පිළියෙල කිරීම සිදු කරන ලදී. 2012/13 මහ කන්නය සහ 2013 යල කන්නය තුළ අස්වද්දන ලද, වපුරන ලද හා අස්වැන්න නෙළාගන්නා ලද බිම් ප්‍රමාණයන් පිළියෙල කරන ලදී. 2012/13 මහ කන්නයට අදාල වී අස්වැන්න පිළිබඳ අවසන් වාර්තාව දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කරන ලද අතර 2013 යල කන්නයට අදාල යාවකාලික වාර්තාව පිළියෙල කිරීම සිදු වෙමින් පවතී.

### 2.2.2 ආහාර ශේෂ පත්‍රය

වාර්ෂිකව පිළියෙල කරනු ලබන ආහාර ශේෂ පත්‍රය මගින් ඒක පුද්ගල ආහාර සැපයුම පෙන්නුම් කරන අතර, ඒ මගින් ජාතික මට්ටමින් රටේ පෝෂණ තත්වය පිළිඹිබු කෙරේ. 2012 වර්ෂය සඳහා ආහාර ශේෂ පත්‍රය වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

### 2.2.3 ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන හා සත්ව සංඛ්‍යාති

2012/13 මහ කන්නයේ ගොඩ ගොවිතැන් සංඛ්‍යාති සඳහා අවසන් වාර්තාව පිළියෙල කර දත්ත භාවිතා කරන්නන් හට ලබා දීමත්, 2013 යල කන්නයේ එක් එක් බෝග සඳහා පුරෝකථන පිළියෙල කිරීමත් අවසන් කර ඇත.

මීට අමතරව 2013 යල කන්නය සඳහා අර්තාපල් අස්වැන්න පිළිබඳ සමීක්ෂණයේ අවසන් වාර්තාව හා ලොකු ළූණු අස්වැන්න පිළිබඳ සමීක්ෂණයේ අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.

### 2.2.4 ජාතික ගිණුම්

ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් සකස් කිරීමේ නිල වගකීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව නිෂ්පාදන, ආදායම් හා වියදම් ක්‍රම යටතේ වාර්ෂිකවද නිෂ්පාදන ක්‍රමය යටතේ කාර්තුගතවද ජාතික ගිණුම් ඇස්තමේන්තු සකස් කෙරේ.

වර්ෂයක් හෝ කාර්තුවක් අවසන් වූ විගස එම කාලයට අදාළ ජාතික ගිණුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත රැස් කිරීම ආරම්භ කෙරේ. දෙපාර්තමේන්තුවේ සංගණන හා සමීක්ෂණවල දත්ත ද වෙනත් සකස් කරන දත්ත හා දර්ශකද ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව, මහා භාණ්ඩාගාරය, ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික ආයතන රැසක දත්ත ද මේ යටතේ රැස් කෙරේ.

වර්ෂයකට අදාළ ජාතික ගිණුම් කඩිනම් ඇස්තමේන්තු හා කාර්තුගත ජාතික ගිණුම් ඇස්තමේන්තු අදාළ වර්ෂය අවසන් වී දින 75 කදී ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව, 2012 වාර්ෂික හා සිවුවැනි කාර්තුවේ සහ 2013 පළමු දෙවැනි හා තෙවැනි කාර්තුවල ඇස්තමේන්තු සකස් කරන ලදී. සකස් කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු සංඛ්‍යා වගු හා එයට අදාළ කෙටි විශ්ලේෂණයක් සහිත මාධ්‍ය සටහන් නියමිත පරිදි දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියට ඇතළත් කිරීමෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

2013 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව හා වෙනත් දේශිය හා විදේශීය ආයතන හා පුද්ගලයන්ට වර්ෂය පුරා සපයන ලදී.

ජාතික ගිණුම් වාර්ෂික ප්‍රකාශනයෙහි 39 වැනි නිකුතුව ලෙස " NATIONAL ACCOUNTS OF SRI LANKA – 2012" 2013 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

**වගුව 3 : වාර්ෂික ජාතික ගිණුම් ඇස්තමේන්තුවල ප්‍රධාන දර්ශක**

| දර්ශකය | 2011 | 2012* |
|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය(%) | 8.2 | 6.4 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (රුපියල්) | 313,576 | 373,001 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඇමෙරිකානු ඩොලර්) | 2,836 | 2,923 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (රුපියල්) | 310,124 | 365,699 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමෙරිකානු ඩොලර්) | 2,805 | 2,866 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඇමෙරිකානු ඩොලර්) වර්ධනය (%) | 18.2 | 3.1 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමෙරිකානු ඩොලර්) වර්ධනය (%) | 15.7 | 17.9 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය (2002=100) | 228.5 | 248.8 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය අනුව උද්ධමනය (%) | 7.9 | 8.9 |

* යාවකාලික

### 2.2.5 කොළඹ පාරිභෝගික මිල දර්ශකය - (පදනම 2006/07 = 100)


පාරිභෝගික මිල වෙනස්වීම පිළිබඳ නව සහ වඩාත් විශ්වාසදායී දර්ශකයක අවශ්‍යතාවය හඳුනාගෙන, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 ජූනි මාසයේදී නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය සකස් කරන ලදී.

2006/07 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය පදනම් කර සකස් කරන ලද මෙම නව දර්ශකය, කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය, 2006/07 නම් වේ (කො.පා.මි.ද. 2006/07=100). මෙමඟින් කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම නාගරික ගෘහ ඒකක නියෝජනය වේ. සාමාන්‍යයෙන් පාරිභෝගික වියදම් සමීක්ෂණ පදනම් කර ගෙන පාරිභෝගික මිල දර්ශක සංශෝධනයට ලක් කල යුතු අතර පරිභෝජන රටාවේ වෙනස්වීම් පිළිඹිබු කිරීමට අවම වශයෙන් අවුරුදු 05 ත් 10 ත් අතර කාලයකට වරක් බර තැබීම් සංශෝධනය කල යුතු වේ. පැරණි දර්ශකය සඳහා 12 ක්ව පැවති මිල රැස් කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව නව දර්ශකය සඳහා 14 ක් දක්වා පුළුල් කර ඇත. එම මධ්‍යස්ථාන නම්, පිටකොටුව, මරදාන, වැල්ලවත්ත, දෙමටගොඩ, ග්‍රෑන්ඩ්පාස්, බොරැල්ල, කිරුළපන, දෙහිවල, කෝට්ටේ, නුගේගොඩ, කොළොන්නාව, රත්මලාන හා නාරාහේන්පිට සහ රත්මලාන පිහිටි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන දෙක වේ.

මේ නව දර්ශකය ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමේ නිල මිනුම ලෙස 2011 ජූනි මස සිට පිළිගන්නා ලද අතර එමඟින් යල්පැනගිය කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (පදනම 2002=100) ප්‍රතිස්ථාපනය කෙරුණි.

**වගුව 4 : කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ විචලනය, 2012/2013**

| වර්ෂය | මාසය | දර්ශක අංකය | උද්ධමන අනුපාතිකය (ලක්ෂමය උද්ධමනය) |
|---|---|---|---|
| **2012** | ජනවාරි | 154.8 | 3.8 |
| | පෙබරවාරි | 155.4 | 2.7 |
| | මාර්තු | 158.8 | 5.5 |
| | අප්‍රියෙල් | 159.8 | 6.1 |
| | මැයි | 162.1 | 7.0 |
| | ජූනි | 165.2 | 9.3 |
| | ජූලි | 166.7 | 9.8 |
| | අගෝස්තු | 165.7 | 9.5 |
| | සැප්තැම්බර් | 165.5 | 9.1 |
| | ඔක්තෝම්බර් | 165.0 | 8.9 |
| | නොවැම්බර් | 167.1 | 9.5 |
| | දෙසැම්බර් | 168.6 | 9.2 |
| **2013** | ජනවාරි | 170.0 | 9.8 |
| | පෙබරවාරි | 170.7 | 9.8 |
| | මාර්තු | 170.8 | 7.5 |
| | අප්‍රියෙල් | 170.0 | 6.4 |
| | මැයි | 173.9 | 7.3 |
| | ජූනි | 176.5 | 6.8 |
| | ජූලි | 176.8 | 6.1 |
| | අගෝස්තු | 176.2 | 6.3 |
| | සැප්තැම්බර් | 175.8 | 6.2 |
| | ඔක්තෝම්බර් | 176.1 | 6.7 |
| | නොවැම්බර් | 176.5 | 5.6 |
| | දෙසැම්බර් | 176.5 | 4.7 |




**සටහන 1 : කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම (2006/07)**

### 2.2.6 නිෂ්පාදක මිල දර්ශකය (PPI)

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මිල අංශය මගින් රට තුළ සිදු කෙරෙන ප්‍රධාන කෘෂිකාර්මික මිල ගණන් රැස් කිරීම මාසිකව සිදු කරනු ලැබුවත් මේ වනතෙක් කිසිදු දර්ශකාංකයක් ගණනය කර නොමැත. දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා වල මිල ගණන් වෙනස් වීම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා, නිෂ්පාදක මිල දර්ශකය ඉතාමත් වැදගත් දර්ශකයකි.

2012 වර්ෂයේදී කෘෂිකාර්මික අංශය සඳහා නිෂ්පාදකයාගේ මිල දර්ශකය පිළියෙල කිරීමට මූලික පියවර ගත් අතර 2013 දී අත්හදා බැලීමේ පදනමින් එය ගොඩ නගන ලදී.

2013 වර්ෂයේ මුල් භාගයේ මෙම අංශයට පැමිණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදේශකයෙකු විසින් ඒ අවස්ථාවේ නිෂ්පාදකයාගේ මිල දර්ශකය ගණනය කිරීමේ කටයුතු සොයා බලන ලදී. එහිදී නිෂ්පාදකයාගේ මිල දර්ශකයට අදාල ආවරණ පථය පුළුල් කිරීමට අවශ්‍ය පසුබිම පිළිබඳව සාකච්ඡා වූ අතර එහිදී දෙපාර්තමේන්තුව දැනටමත් රැස් කරනු ලබන නිෂ්පාදන කර්මාන්ත හා උපයෝගීතා යන අංශ සම්බන්ධ තොරතුරු යොදා ගනිමින් නිෂ්පාදකයාගේ මිල දර්ශකය ගණනය කිරීමට තීරණය විය.

ඒ අනුව නිෂ්පාදන අංශයේ කැපී පෙනෙන නිමැවුම් සහිත ජාත්‍යාන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණයේ අංක හතරකින් යුත් කාර්යයන් තෝරා ගන්නා ලද අතර ආර්ථික කටයුතු ආයතන සඳහා බර තැබීම් පිළියෙල කොට අවසන් කර ඇත.

### 2.2.7 සිල්ලර හා නිෂ්පාදන මිල ගණන්

සියලුම දිස්ත්‍රික්ක වල නගරයන්හි ආහාර හා විවිධ පාරිභෝගික භාණ්ඩ පිළිබඳ සිල්ලර මිල ගණන් සතිපතා, මාසික හා වාර්ෂික පදනමක් මත දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සංඛ්‍යාන කාර්ය මණ්ඩලය යොදා ගනිමින් මිල අංශය මඟින් එක් රැස් කරනු ලබන අතර මෙරට ද්‍රව්‍ය වගාකරන්නන්ගේ මිල ගණන් ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රමවත්ව, මාසිකව දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සංඛ්‍යාන කාර්ය මණ්ඩලය යොදා ගනිමින් මිල අංශය මඟින් එක් රැස් කරනු ලැබේ.

2013 වර්ෂය සඳහා නාගරික සිල්ලර මිල ගණන් හා නිෂ්පාදකයාගේ මිල ගණන් රැස් කිරීමේ පෝර්ම සංශෝධනය කරන ලද අතර මිල රැස් කරනු ලබන අයිතමයන් ගණන ද ජාතික ගිණුම් අංශයේ දත්ත අවශ්‍යතාවයන් මත වැඩි කරන ලදී.

2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සතිපතා සිල්ලර මිල ගණන් (කොළඹ දිස්ත්‍රික්කය) හි මිල විවරණිකාවේ 21 වන නිකුතුව මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී.

### 2.2.8 අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබද සංඛ්‍යාති

සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට සිටි සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු මෙමඟින් ඉදිරිපත් කරනු ලැබේ. 2011 වර්ෂයට අදාල දත්ත වගු ලබාගෙන දෙපාර්තමේන්තු ප්‍රකාශන වල පල කිරීම සඳහා බාර දී ඇති අතර 2012 වර්ෂයට අදාල දත්ත ඒ ඒ ආයතන වලින් ලබා ගැනීමට පියවර ගෙන ඇත.

### 2.2.9 පුහුණු කටයුතු

පුහුණු අංශය මඟින් 2013 වර්ෂය සඳහා පුහුණු පාඨමාලා කිහිපයක්ම පවත්වා ඇති අතර නිලධාරීන් 33 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධන වාර්තාව පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දෙමළ භාෂාව පිළබඳ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද දෙමළ භාෂා පුහුණු වැඩ සටහන හොඳින් ක්‍රියාත්මක වන අතර

මට්ටම් අනුව පුහුණු පංති 3 ක් පවත්වා ඇත. දෙමළ භාෂා පුහුණුව III මට්ටමේ සිට I වන මට්ටම දක්වා, දෙමළ භාෂා පුහුණුව III මට්ටම සහ දෙමළ භාෂා පුහුණුව II මට්ටම මෙම පුහුණු පංති 3 වේ.

අධ්‍යයන චාරිකාවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි නේපාලයේ නිලධාරීන් දස දෙනා සඳහා පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලද අතර එහි සමාරම්භක උත්සවයේ සිට අවසන් දිනයේ සහතික පත්‍ර බෙදා දෙන උත්සවය දක්වා සියළු කටයුතු විධිමත් ආකාරයෙන් සිදු කිරීමට දායකත්වය ලබා දෙන ලදී.

සංඛ්‍යාලේඛනඥවරුන්, සංඛ්‍යාලේඛන නිලධාරීන් හා සංඛ්‍යාලේඛන සහකාර වරුන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාග නිසි වේලාවට පැවැත්වීමට හැකි වූ අතර මූලික පරිගණක පුහුණුව, Page Maker පුහුණු පාඨමාලාව, ඉන්වෙන්ට්‍රි භාණ්ඩසම්බන්ධ කටයුතු පිළිබඳ සම්බන්ධ පුහුණුව, Advanced Multimedia Content Development Using Adobe Flash පුහුණු පාඨමාලාව දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පවත්වන ලදී.

### 2.2.10 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු

දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ සංගණන හා සමීක්ෂණ වල දත්ත සැකසුම් කටයුතු ද ඇතැම් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල පිහිටුවා ඇති සංඛ්‍යාලේඛන අංශ වලට අයත් දත්ත සැකසුම් කටයුතු ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මගින් සිදු කරගෙන යන ලදී. ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය, ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2012/13, ජන හා නිවාස සංගණනය - 2011, 5% නියැදිය, පශ්වාත් ගණන් ගැනීමේ සමීක්ෂණය - 2012 ට අදාල දත්ත සැකසුම් මෙම අංශය මගින් ඉටු කරන ලද වැදගත් කාර්යයන් වේ. මීට අමතරව කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය ඇතුළු අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු තුල පිහිටුවන ලද සංඛ්‍යාලේඛන අංශ මගින් රැස් කරන දත්ත සැකසුම් කිරීම ද සිදු කරන ලදී.දෙපාර්තමේන්තුව මගින් රැස් කරනු ලබන සංඛ්‍යාන තොරතුරු සැපයීම හා දත්ත කඩිනමින් මුදා හැරීම හා සම්බන්ධ අනෙකුත් කටයුතු සිදු කිරීමට හැකි වන පරිදි දත්ත භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් වන ආකාරයට වෙබ් අඩවිය ප්‍රතිව්‍යුහගත කිරීම, සෙවුම් යන්ත්‍රය වැඩි දියුණු කිරීම මෙම අංශය මගින් සිදු කෙරෙන අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය පවත්වාගෙන යාම හා එය යාවත්කාලීන කිරීම මෙම අංශයේ තවත් වගකීමක් වේ. මීට අමතරව ක්ෂුද්‍ර දත්ත ඉල්ලුම්කරුවන් සඳහා ඒවා නිකුත් කිරීම හා දෙපාර්තමේන්තු ප්‍රකාශන සංයුක්ත තැටි ආකාරයෙන් ලබා දීම මෙම අංශය මගින් කෙරෙන තවත් කාර්යයන් වන අතර මෘදුකාංග ගැටළු නිරාකරණය කිරීම හා එම අංශ වල පරිගණක ජාල පද්ධතිය ස්ථානගත කිරීමද මෙම අංශය මගින් සිදු කරන ලදී.

### 2.2.11 ප්‍රකාශන කටයුතු

සංඛ්‍යාන නිබන්ධනය, සංඛ්‍යාන අත්පොත, වාර්ෂික කාර්ය සාධන වාර්තාව, දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මුද්‍රණය හා ප්‍රකාශයට පත්කිරීම ප්‍රකාශන අංශයේ මූලික කාර්ය භාරය වේ.

2012 වර්ෂය සඳහා වූ දත්ත ඇතුලත් මෙම සියළුම ප්‍රකාශන මුද්‍රණය කොට බෙදා හරින ලද අතර අදාල ප්‍රකාශන වෙබ් අඩවියේ පල කරන ලදී. පළාත් පාලන සංඛ්‍යාති රැස් කිරීම සිදු කොට ත්‍රෛමාසික හා වාර්ෂික දත්ත ඇතුලත් වගු පිළියෙල කරන ලද අතර මූලික සංඛ්‍යාති වලින් සමන්විත ත්‍රෛභාෂික දත්ත පත්‍රිකාවද එලි දක්වන ලදී.දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන සියළුම ප්‍රකාශන හා පත්‍රිකා සඳහා ISBN හා ISSN අංක ලබා දීමත්, එම ප්‍රකාශන වලට මිල නියම කිරීමත් සිදු කර ඇති අතර එම සියළුම ප්‍රකාශන බෙදා හැරීමේ කටයුතු ද නොපමාව ඉටු කර ඇත.

අම්පාර දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුල - 2013 ප්‍රදර්ශන කුටිය සඳහා ප්‍රශ්නාවලිය සකස් කිරීමේ කටයුතු ද ප්‍රකාශන අංශය වෙත පැවරුණ අතර එයද මනාව සකස් කොට බාර දෙන ලදී.

### 2.2.12 මුද්‍රණ කටයුතු

දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ සඳහා උපලේඛන, ප්‍රශ්නාවලි උපදෙස් අත්පොත් මෙන්ම සංගණන හා සමීක්ෂණ වාර්තා ද මුද්‍රණය කිරීම දෙපාර්තමේන්තුවේ මුද්‍රණ අංශයේ වගකීම වේ.

2013 වසර තුලදී පහත සඳහන් ප්‍රකාශන මුද්‍රණය කරන ලදී.

1. ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය 2010 - සිංහල වාර්තාව
2. සංඛ්‍යාන නිබන්ධනය
3. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/10 වාර්තාව (සිංහල)
4. ක්ෂේත්‍ර දින පොත - 2013
5. ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය 2012 - දෙවන කාර්තුව සඳහා වූ වාර්තාව
6. සංඛ්‍යාන සාක්කු දින පොත - 2012
7. ආර්ථික සංගණනය - 2013/14 කර්මාන්ත වෙළඳපල ලැයිස්තුගත කිරීමට අදාල පෝරමය
8. වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2012
9. LLRC සංගණනයට අදාල සියළු ආකෘති පත්‍ර
10. 2014 වර්ෂයේ ක්ෂේත්‍ර දින පොත

### 2.2.13 සිතියම් විද්‍යා කටයුතු

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි 2011 ජන හා නිවාස සංගණනයේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමෙන් මූලික ජනගහන තොරතුරු ඇතුලත් කොට දිස්ත්‍රික්ක 25 සඳහා සකස් කරන ලද සිතියම් සංග්‍රහය එම අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

2011 ජන හා නිවාස සංගණනය සඳහා සකස් කල ග්‍රාම නිලධාරි සිතියම් අංකිත කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක වලට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ සිතියම් අංකිත කිරීම ආරම්භ කොට ඇත.

### 2.2.14 දත්ත ප්‍රචාරණය කිරීමේ කටයුතු

පාර්ලිමේන්තුව හා අනිකුත් රාජ්‍ය ආයතන වල දත්ත අවශ්‍යතා සපුරාලීම දත්ත ප්‍රචාරණය කිරීමේ ඒකකයෙහි කාර්යභාරය වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර දත්ත ගොනු බෙදා හැරීම, එම දත්ත ගොනු බෙදා හැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව 25% දත්ත හා සම්පූර්ණ දත්ත ගොනු අදාල ඉල්ලුම් කරුවන් වෙත ලබා දීම මෙම අංශයේ තවත් කාර්යභාරයකි. ඒ අනුව 2013 වර්ෂය සඳහා 25% දත්ත ගොනු 36 ක්ද සම්පූර්ණ දත්ත ගොනු 24 ක්ද නිකුත් කර ඇත.

### 2.2.15 පුස්තකාලය

බැහැර දෙන සහ විමර්ශන අංශයන්ගෙන් සමන්විත දෙපාර්තමේන්තු පුස්තකාලයේ කෘෂිකර්මය, පරිගණක විද්‍යාව, ප්‍රජා විද්‍යාව, ආර්ථික විද්‍යාව, මානව සම්පත්, කර්මාන්ත, කළමණාකරනය, ගණිතය, ජාතික ගිණුම්, මිල, වෙළඳාම හා වැටුප් වැනි විෂයය ක්ෂේත්‍රයන්ට අදාල ග්‍රන්ථ අඩංගු වේ. මෙම සියළුම පොත් ඩීඩීසී 21 (DDC) 21 වන සංස්කරණය අනුව අදාල ග්‍රන්ථයේ විෂයය නිශ්චිතව තීරණය කර වර්ග අංකයක් ලබා දී ඇත. පුස්තකාලයේ පරිගණක කටයුතු අන්තර්ජාලය පදනම් වූ පරිගණක ගත පුස්තකාල සූචි පිළිබඳ ව්‍යාපෘති යටතේ විධිමත් කර ඇත.

2013 වසරේ අම්පාර දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුල ප්‍රදර්ශනයේදී දෙපාර්තමේන්තු පුස්තකාල පොත් පත් වලින් සමන්විත ප්‍රදර්ශනය හා අලෙවිකුටි පවත්වාගෙන යන ලදී. දෙපාර්තමේන්තු ඵලදායිතාවය වැඩි කිරීමේ අරමුණු ඇතිව මාධ්‍යවේදීන් සඳහා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී

### 2.2.16 ක්ෂේත්‍ර කළමණාකරණ කටයුතු

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ හා ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණ කටයුතු මනාව සිදු කිරීම සඳහා දිස්ත්‍රික් සංඛ්‍යාල්ඛන අංශ වලට අවශ්‍ය විවිධ ප්‍රතිපාදන, භෞතික පහසුකම් හා විවිධ ආකෘති පත්‍ර ලබා දීම ක්ෂේත්‍ර කළමණාකරණ අංශයේ වගකීමයි. එය සපුරාලමින් මෙම වර්ෂයේ කාර්තුමය වශයෙන් ඉන්ධන, රියදුරු බටා හා අතිකාල දීමනා සඳහා ප්‍රතිපාදන ලබා දීමත් සය මාසික වශයෙන් යවනු ලබන දිස්ත්‍රික් ප්‍රධානීන්ගේ හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මාසික ගමන් වියදම් සඳහා ප්‍රතිපාදන ලබා දීමත් ප්‍රධාන කොට අනෙකුත් ප්‍රතිපාදන යැවීම් සිදු කරන ලදී.

දිස්ත්‍රික් අංශ ප්‍රධානීන්ගේ වාර්ෂික වැඩමුළුව හා වාර්ෂික ප්‍රජාවිද්‍යාත්මක, කර්මාන්ත හා කෘෂිකාර්මික කමිටු රැස්වීම් මෙම වර්ෂය තුලද පැවැත්වීමට නියමිතව තිබුනත් ආර්ථික සංගණනය ඇතුළු අනෙකුත් සංගණන කටයුතු සඳහා නිලධාරීන් රාජකාරියේ යෙදීම නිසා ඉහත රැස්වීම් සඳහා නිලධාරීන් ඒකරාශී කිරීම ප්‍රායෝගික නොවූ බැවින් එය ඉටු කිරීමට නොහැකි විය.

## 2.3 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

### 2.3.1 වාර්ෂික රැකියා සමීක්ෂණය

දිවයිනේ පිහිටි අර්ධ රාජ්‍ය හා පුද්ගලික අංශ දෙකෙහි අර්ථසාධක අරමුදලට දායක වන ව්‍යාපාර හා සේවා ආයතන සම්බන්ධව වසරේ ජූනි මස වැඩ කරන දිනය පදනම්ව තොරතුරු ලබා ගැනේ.

ස්ථර අනුව ප්‍රමාණයට සමානුපාතිකව තෝරා ගත් නියැදියක් මගින් තැපැල් මාර්ගිකව වාර්ෂිකව තොරතුරු රැස් කිරීම සිදු කෙරේ. මෙම තොරතුරු වාර්තාව මගින් දිවයිනේ සංවිධානය වූ සේවා නියුක්තිය, කර්මාන්ත වර්ගීකරණ තොරතුරු ඇතුළු තවත් වැදගත් තොරතුරු වාර්ෂිකව ප්‍රකාශයට පත් කෙරේ.

ඉහත සමීක්ෂණයට අදාල 2012 වර්ෂයේ වාර්තාව පිලියෙල කොට මුද්‍රණය සඳහා භාර දී ඇති අතර 2013 වර්ෂයේ වාර්තාව පිලියෙල කර අවසන් වී ඇති නමුත් මුද්‍රණ කටයුතු 2014 වර්ෂයේ පළමු කාර්තුවේ සිදු කිරීමට අපේක්ෂිතය.

### 2.3.2 සාමාන්‍ය ඉපයීම් සහ වැඩ කරන කාලය පිළිබඳ සමීක්ෂණය

සෑම වසරකම මාර්තු සහ සැප්තැම්බර් මාසවලදී වර්ෂයකට දෙවරක් තැපැල් මාර්ගිකව තොරතුරු රැස් කරනු ලැබේ. මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ පඩිපාලක සහා යටතේ සේවය කරන සේවා නියුක්තිකයින්ගේ සාමාන්‍ය ඉපයීම් සහ වැඩකරන කාලය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමයි. ලබා ගන්නා තොරතුරු " The Survey on hours of actually worked and average earnings" මගින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර එමගින් ඉපයීම් රටාව විග්‍රහ කරනු ලැබේ.

### 2.3.3 අධ්‍යාපන සංඛ්‍යාති

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාපිත කොට ඇති සංඛ්‍යාලේඛන අංශය මගින් වාර්ෂිකව සිදු කරන පාසැල් සංගණනයට සමගාමීව පුද්ගලික පාසැල්, පිරිවෙන්, ගුරු අභ්‍යාස විද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨ පිළිබඳ තොරතුරු ද රැස් කරන ලදී. වාර්ෂිකව එලි දක්වන මූලික සංගණන වාර්තාව පිලියෙල කෙරෙමින් පවතින

අතර ඊලඟ වසරේ පළමු කාර්තුව තුල එම දත්ත වෙබ් පිටුවේ පල කිරීම හා ප්‍රකාශන වලට අවශ්‍ය විශ්ලේෂිත අධ්‍යාපන දත්ත ලබා දීමට අපේක්ෂිතය.

### 2.3.4 වෛද්‍ය සංඛ්‍යාති

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශය මගින් රාජ්‍ය අංශයේ රෝහල් වල නේවාසික රෝගීන්, බාහිර රෝගීන්, සායන ප්‍රතිකාර ලබන්නන්, මාතෘ සංඛ්‍යාති, මරණ, ඇඳන්, වෛද්‍යවරුන්, සේවක පිරිස සහ සෞඛ්‍ය පහසුකම් ආදී සංඛ්‍යාති රැස් කිරීම අඛණ්ඩව සිදු කරනු ලබන අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ මට්ටමින් ජනගහන ඇස්තමේන්තු සකස් කිරීම ද සිදු කරනු ලබයි.

2011 හා 2012 වර්ෂ වලට අදාලව එක් එක් ආයතන වලින් ලබා ගත් දත්ත පරිගණක ගත කිරීම අවසන් වී ඇති අතර දත්ත විශ්ලේෂණ කටයුතු ද සිදු කරන ලදී. 2010 වර්ෂයේදී හඳුන්වා දුන් අන්තර් ජාල මගින් දත්ත රැස් කිරීමේ වැඩසටහන මෙම වර්ෂයේදී විශාල ලෙස ව්‍යාප්ත කරන ලදී.

ඒ සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාල 26 ක පුහුණු වැඩසටහන් වෙන වෙනම පැවැත්වූ අතර එම පුහුණු වැඩසටහන් අවසන් වීමත් සමග රජයේ රෝහල් 98 ක් පමණ මෙම වැඩසටහනට ලියාපදිංචි වී, අදාල දත්ත අන්තර්ජාලය හරහා එවීමට කටයුතු කරන ලදී.

### 2.3.5 ජීව සංඛ්‍යාති

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය මගින් උපත්, මරණ, විවාහ ආදී ජීව සංඛ්‍යාති එක් රැස් කිරීම නොකඩවා සිදු කරනු ලැබේ. 2009 වර්ෂය සඳහා උපත් හා මරණ වලට අදාල දත්ත සැකසීම අවසන්ව ඇති අතර අවසන් දත්ත ප්‍රකාශයට පත් කර ඇත. 2010 වර්ෂයේ තොරතුරු පරිගණක ගත කිරීම අවසන් කර ඇති අතර දත්ත සංස්කරණය හා අඩුපාඩු ගෙන්වා ගැනීම සිදු කෙරෙමින් පවතී. 2012 වර්ෂයට අදාල ජීව සංඛ්‍යාති දර්ශක පිළියෙල කිරීම අවසන් කර ඇත. 2013 වර්ෂය සඳහා වයස් කාණ්ඩ හා දිස්ත්‍රික් අනුව මධ්‍ය වාර්ෂික ජනගහනය සකස් කොට අවසන් කර ඇත.

### 2.3.6 ධීවර සංඛ්‍යාති

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශය මඟින් කරදිය හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය, තොග සහ සිල්ලර මත්ස්‍ය මිල ගණන් සහ මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය හා අපනයනය පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා නිකුත් කිරීම නොකඩවා සිදු කරනු ලබන අතර 2013 වර්ෂය සඳහා වූ තොරතුරු ඇතුලත් ප්‍රකාශන වල වැඩ කටයුතු මේ වන විට අවසන් කොට ඇත.

මීට අමතරව 2013 වර්ෂය සඳහා දෙපාර්තමේන්තු ප්‍රකාශන, මහ බැංකු වාර්තා, ජාත්‍යන්තර ආයතන සඳහා අවශ්‍ය දත්ත ලබා දීමද සම්පූර්ණ කර ඇත.

### 2.3.7 අවම වැටුප් දර්ශකය

පඩිපාලක සභා ආඥා පනත යටතේ කම්කරු දෙපාර්තමේන්තුව මගින් පඩිපාලක සභා අනුව නියම කරනු ලබන අවම වැටුප් පදනම් කොට මාසිකව අවම වැටුප් අනුපාත දර්ශකාංක ගණනය කරනු ලැබේ. මෙම දර්ශකාංකය කෘෂි අංශය (වැවිලි අංශය) කර්මාන්ත, වාණිජ, සේවා යන ප්‍රධාන අංශ සඳහා වෙන් වෙන්ව හා ඒකාබද්ධව ගණනය කරනු ලබන අතර එමගින් ප්‍රධාන අංශ වල අවම වැටුප් මට්ටම් වල වෙනස් වීම් නිරීක්ෂණය කරනු ලැබේ. 2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා පිළියෙල කරන ලද අවම වැටුප් දර්ශකාංක වාර්තාව ප්‍රකාශයට පත්කොට ඇත.

### 2.3.8 කම්කරු සංඛ්‍යාති පිළිබඳ ප්‍රකාශනය 2013

කම්කරු ක්ෂෙත්‍රයට සම්බන්ධ විවිධ දත්ත ප්‍රකාශයට පත් කරනු ලබන 2013 වර්ෂය සඳහා වූ කම්කරු සංඛ්‍යාති වාර්ෂික ප්‍රකාශනය කම්කරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කොට ඇති අතර එය මුද්‍රණය කොට එළි දැක්වීමට ද සියළු කටයුතු සූදානම් කොට ඇත.

### 2.3.9 රේගු සංඛ්‍යාති

රේගු වාර්තාවලින් උපුටාගනු ලබන තොරතුරු පදනම් කරගත් ආනයන හා අපනයන දත්ත රැස් කිරීම, සකස් කිරීම, විශ්ලේෂණය කිරීම හා බෙදා හැරීම ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශයේ වගකීම වේ. ආනයන හා අපනයන මාසික දත්ත ඇතුලත් පරිගණක සටහන් රජයේ ආයතන වලට හා වෙනත් දත්ත පරිහරණය කරන්නන්ට ඔවුන්ගේ ඉල්ලීම් අනුව සපයනු ලැබේ.

බාහිර වෙළඳ සංඛ්‍යාති පිළිබඳ 2012 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කර ඇති අතර බාහිර වෙළඳ සංඛ්‍යාති පිළිබඳ අත්පොත මුද්‍රණය කිරීම සඳහා සියළු කටයුතු සූදානම් කොට ඇත.

## 3. පරිපාලනය

### 3.1 අංශ, ශාඛා කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල

### 3.1.1 අංශ සහ ඒකක

පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15 සහ ඒකක 3 මගින් 2013 වසර තුල කාර්යයන් මෙහෙයවිණි.

| | |
|---|---|
| 1 වන අංශය | ජන සංගණන හා ප්‍රජා විද්‍යාත්මක |
| 2 වන අංශය | කර්මාන්ත, ඉදිකිරීම්,වෙළඳ හා සේවා |
| 3 වන අංශය | කෘෂිකර්මය හා පාරිසරික |
| 4 වන අංශය | ජාතික ගිණුම් |
| 5 වන අංශය | ප්‍රකාශන |
| 6 වන අංශය | පුස්තකාල හා ප්‍රලේඛන |
| 7 වන අංශය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ |
| 8 වන අංශය | පරිපාලන හා ගිණුම් |
| 9 වන අංශය | නියැදි සමීක්ෂණ |
| 10 වන අංශය | මුද්‍රණ |
| 11 වන අංශය | ක්ෂේත්‍ර කළමණාකරන |
| 12 වන අංශය | පුහුණු |
| 15 වන අංශය | පර්යේෂණ හා විශේෂ අධ්‍යයන |
| 16 වන අංශය | මිල හා වේතන |
| 18 වන අංශය | සිතියම් විද්‍යා |

අන්තර් ජාතික සංඛ්‍යාලේඛන ඒකකය

දත්ත ප්‍රචාරණ ඒකකය

LLRC සංගණන ඒකකය

### 3.1.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල

මෙම දෙපාර්තමේන්තුව විසින් විවිධ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ තුල ශාඛා කාර්යාල 43 ක් පමණ පවත්වාගෙන යයි. මෙම ශාඛා කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛන නිලධාරීවරයෙකු හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරිවරයෙකු යටතේ පවතී.

### 3.1.3 දිස්ත්‍රික් කාර්යාල

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ මහවැලි සංවර්ධන බල ප්‍රදේශයට අයත් මහවැලි එච් කලාපයේ ගල්නෑවේ එක් කාර්යාලයක් ද වේ. මෙම කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු හෝ සංඛ්‍යාලේඛනඥවරයෙකු භාරයේ පවතින අතර ඔහුට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරීන් සහ සංඛ්‍යාලේඛන සහකාරවරුන් ද වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සහ දිස්ත්‍රික්ක මට්ටමින් දත්ත එකතු කිරීම, සකස් කිරීම සහ විවිධ සංඛ්‍යානමය දත්ත සම්බන්ධීකරණය කිරීමේ වගකීම මෙම දිස්ත්‍රික්ක කාර්යාල වලට පැවරේ.

### 3.1.4 පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය

වෘත්තීය දක්ෂතා පෙන්වන සංඛ්‍යාලේඛන කාර්ය මණඩලයක් අනුයුක්ත කරමින් පලාත් සභාවලට සංඛ්‍යාලේඛන සේවාව සැපයීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මේ අනුව කාර්ය මණ්ඩලය තාවකාලික පදනම මත මෙම දෙපාර්තමේන්තුවෙන් මුදා හැරීමෙන් පළාත් සභාවලට අනුයුක්ත කර ඇත. වඩාත් සුදුසු සංඛ්‍යානමය සම්බන්ධීකරණය, සංඛ්‍යාලේඛන ප්‍රමිතීන් පවත්වාගෙන යාම හා කාර්ය මණ්ඩලයේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම මෙමගින් තහවුරු කර ඇත. තාවකාලික මුදා හැරීම මගින් දෙපාර්තමේන්තුව මෙම නිලධාරීන් සැපයීමට පළාත් සභා සමඟ වැඩ සටහන් සම්පාදනය කරන ලදී.

### 3.2 කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව 2013.12.31 දිනට | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(සංඛ්‍යාන/තොරතුරු තාක්ෂණ) | 3 | 0 | 3 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පරිපාලන) | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 11 | 2 | 9 |
| අධ්‍යක්ෂ (තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවය) | 1 | 0 | 1 |
| ගණකාධිකාරී සේවය | 4 | 3 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ(සංඛ්‍යාන) | 23 | 9 | 14 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ(තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවය) | 4 | 1 | 3 |
| සහකාර අධ්‍යක්ෂ(තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවය) | 19 | 10 | 9 |
| සහකාර අධ්‍යක්ෂ(පාලන) - ශ්‍රී.ල.ප.සේ.III | 1 | 1 | 0 |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 80 | 35 | 45 |
| සංඛ්‍යාලේඛනඥ | 110 | 67 | 43 |
| මුද්‍රණ කළමණාකරු | 1 | 1 | 0 |

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය - අධි පන්තිය | 1 | 1 | 0 |
| සංඛ්‍යාලේඛන සැළසුම්කරු | 1 | 1 | 0 |
| පුස්තකාලාධිපති සේවය | 6 | 2 | 4 |
| භාෂා පරිවර්තක | 3 | 2 | 1 |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 488 | 343 | 145 |
| සංඛ්‍යාලේඛන සහකාර | 213 | 202 | 11 |
| සංවර්ධන නිලධාරි | 80 | 64 | 16 |
| අයවැය සහකාර | 1 | 0 | 1 |
| ශ්‍රී ලංකා තාක්ෂණික සේවය II ආ ඛණ්ඩය (සිතියම් විද්‍යාඥ) | 1 | 1 | 0 |
| පරිලෝචක (මුද්‍රණ) | 1 | 0 | 1 |
| පද්ධති පාලක | 8 | 2 | 6 |
| ජ්‍යෙෂ්ඨ පද්ධති ක්‍රියාකරු | 11 | 4 | 7 |
| ජ්‍යෙෂ්ඨ පද්ධති ලේඛණ භාරකරු | 1 | 0 | 1 |
| දත්ත පාලක | 5 | 0 | 5 |
| තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවය III පංතිය | 149 | 149 | 0 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 200 | 109 | 91 |
| පද්ධති ක්‍රියාකරු | 4 | 0 | 4 |
| පද්ධති ලේඛණ භාරකරු | 1 | 0 | 1 |
| සහකාර දත්ත පාලක | 12 | 3 | 9 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 52 | 21 | 31 |
| දත්ත සටහන් ක්‍රියාකරු/කේත ලිපිකරු | 156 | 122 | 34 |
| දෙමළ මාධ්‍ය ලිපිකරු | 20 | 14 | 6 |
| ටයිප් සෙටර් | 1 | 1 | 0 |
| වැඩ මූලික (මුද්‍රණ) | 2 | 0 | 2 |
| කොම්ටො මීටර් ක්‍රියාකරු | 3 | 1 | 2 |
| ප්‍රොසෙස් හැන්ඩ් | 1 | 0 | 1 |
| වෙරිටයිපර් හෙඩ්ලයිනර් | 1 | 1 | 0 |
| කැමරා ක්‍රියාකරු | 2 | 1 | 1 |
| පොත් බැඳුම්කරු(මුද්‍රණ) | 5 | 1 | 4 |
| ගිලටින් යන්ත්‍ර ක්‍රියාකරු | 2 | 1 | 1 |
| ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු | 3 | 1 | 2 |
| ශුද්ධිපත්‍ර කියවන්නා | 1 | 0 | 1 |
| තහඩු සාදන්නා | 1 | 1 | 0 |
| චිත්‍ර ශිල්පි පිරි සැලසුම්කරු | 1 | 0 | 1 |
| යන්ත්‍ර පරිවාරක | 2 | 2 | 0 |
| රියදුරු | 55 | 54 | 1 |
| වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාකරු | 2 | 1 | 1 |
| යාන්ත්‍රික අංශයේ සේවක | 3 | 0 | 3 |
| කා.සේ.සේ.(ස්ථිර) - මුරකරුද ඇතුලුව | 107 | 102 | 5 |
| කා.සේ.සේ.(දෙපාර්තමේන්තුගත) | 10 | 10 | 0 |
| **එකතුව** | **1875** | **1348** | **527** |
| උපාධිධාරී අභ්‍යාසලාභී (සංවර්ධන නිලධාරි) | - | 5 | - |

## 3.3 විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගිවීම - 2013

| | | |
|---|---|---|
| 1 | අයි.ආර්. බංඩාර මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2013 ජූනි 26 සිට 28 දක්වා මොන්ගෝලියාවේ පැවති 26 වන ජන සංගණන සමුළුව |
| 2 | එස්.ඒ.එස්. බන්දුලසේන මයා<br>අධ්‍යක්ෂ | 2013 ජූනි 26 සිට 28 දක්වා මොන්ගෝලියාවේ පැවති 26 වන ජන සංගණන සමුළුව |
| 3 | පී.එම්.ආර්. ප්‍රනාන්දු මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2013 ජනවාරි 14 සිට 25 දක්වා සිංගප්පූරුවේ පැවති ප්‍රධාන තොරතුරු නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කළමණාකරන පුහුණු වැඩසටහන |
| 4 | එස්.ඒ.එස්. බන්දුලසේන මයා<br>අධ්‍යක්ෂ | 2013 අප්‍රේල් 23 සිට 25 දක්වා තායිලන්තයේ පැවති සංඛ්‍යාන තොරතුරු ක්‍රම කළමණාකරනය පිළිබඳ ඒකාබද්ධ UNECE/EURO STAT /OECD/ESCAP රැස්වීම |
| 5 | එච්.එස්. වනසිංහ මයා<br>අධ්‍යක්ෂ | 2013 මාර්තු 14 සිට 22 දක්වා මලයාසියාවේ පැවති RDTA – 7507: 2011 ICP ආසියා හා ශාන්තිකර තාක්ෂණික ඇගයීම සඳහා 2011 ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන |
| 6 | ඒ.ජී.එස්. කාරියවසම් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2013 මාර්තු 14 සිට 22 දක්වා මලයාසියාවේ පැවති RDTA – 7507: 2011 ICP ආසියා හා ශාන්තිකර තාක්ෂණික ඇගයීම සඳහා 2011 ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන |
| 7 | ඩී.සී.ඒ. ගුණවර්ධන මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2013 පෙබරවාරි 14 සිට මාර්තු 01 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ පැවති එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාලේඛන කොමිසම හා සම්බන්ධ විශේෂ සිදුවීම් පිළිබඳව 44 වනසැසිවාරය, එක්සත් ජාතීන්ගේ මූලස්ථානය, නිව්යෝර්ක් |
| 8 | එච්.ආර්.එල්.එස්. රණතුංග මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2013 අප්‍රේල් 22 සිට 26 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ පැවති ජාතික ගිණුම් පද්ධති පිළිබඳව කලාපීය පුහුණු වැඩසටහන |
| 9 | එස්. තනබාලසිංහම් මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 අප්‍රේල් 05 සිට 06 දක්වා ඉන්දියාවේ පැවති ජාතික සංඛ්‍යාලේඛන සංවිධානය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 10 | ඩී.ඩී.ජී.ඒ. සෙනවිරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2013 අප්‍රේල් 18 සිට 19 දක්වා තායිලන්යේ පැවති සිවිල් ලියාපදිංචිය හා ප්‍රධාන සංඛ්‍යාලේඛනයන්හි ලෝක සමුළුව |
| 11 | ඩී.සී.ඒ. ගුණවර්ධන මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2013 මාරතු 18 සිට 22 දක්වා සිංගප්පූරුවේ පැවති ශ්‍රී ලංකාවේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා විධායක පුහුණුව/සිංගප්පූරුවේ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ලීක්වාන්යූ ජාතික විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික කළමණාකරනය |
| 12 | වයි.පී. රාජපක්ෂ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2013 අප්‍රේල් 02 සිට මැයි 01 දක්වා මලයාසියාවේ පැවති රාජ්‍ය කළමණාකරන උපාධි වැඩසටහන (MPM) සඳහා දෙවනි වරට රට අධ්‍යයන කිරීමේ චාරිකාව |
| 13 | සී.ඩී. ද සිල්වා මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 අප්‍රේල් 16 සිට 19 දක්වා ජපානයේ පැවති නිල සංඛ්‍යාලේඛන වලට ස්ත්‍රී/පුරුෂ භාවය අන්‍යෝන්‍ය සම්බන්ධ අනුව සිතා බැලීමේ ඒකාබද්ධතාවය වැඩි දියුණු කිරීමේ එක්සත් ජාතීන්ගේ වැඩමුළුව |

| | | |
|---|---|---|
| 14 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2013 අප්‍රේල් 09 සිට 10 දක්වා තායිලන්තයේ පැවති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාලේඛන වැඩි දියුණු කිරීමට ගෝලීය උපක්‍රම සඳහා ආසිය හා ශාන්තිකර කලාපයේ කලාපීය මෙහෙයුම් කමිටුවේ පලමුවන රැස්වීම සඳහා සහභාගිවීම |
| 15 | ඩබ්.ඩබ්.එම්.ඒ.එස්. ප්‍රේමකුමාර මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2013 මැයි 14 සිට 16 දක්වා ඉන්දුනීසියාවේ පැවති සමාජ ආරක්ෂණය මැනීම පිළිබඳ පරිමාව දියුණු කිරීමේ වැඩසටහන |
| 16 | ඩී. දීපවංශ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2013 මැයි 14 සිට 16 දක්වා ඉන්දුනීසියාවේ පැවති සමාජ ආරක්ෂණය මැනීම පිළිබඳ පරිමාව දියුණු කිරීමේ වැඩසටහන |
| 17 | එන්.එම්.කේ. නවරත්න මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 මැයි 27 සිට 31 දක්වා තායිලන්තයේ පැවති ICP හා SNA හි ත්‍රෛමාසික IMF සංඛ්‍යාලේඛන සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව |
| 18 | එම්.ටී.ටී. ද සිල්වා මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2013 මැයි 27 සිට 31 දක්වා තායිලන්තයේ පැවති ICP හා SNA හි ත්‍රෛමාසික ජතික ගිණුම් සම්පාදන කටයුතු IMF සංඛ්‍යාලේඛන සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව |
| 19 | බී.ඒ.යූ. වර්ණසිරි මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 මැයි 27 සිට 31 දක්වා තායිලන්තයේ පැවති ICP හා SNA හි ත්‍රෛමාසික ජතික ගිණුම් සම්පාදන කටයුතු IMF සංඛ්‍යාලේඛන සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව |
| 20 | පී.වයි.එම්. සෙනවිරත්න මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 මැයි 27 සිට 31 දක්වා තායිලන්තයේ පැවති ICP හා SNA හි ත්‍රෛමාසික ජතික ගිණුම් සම්පාදන කටයුතු IMF සංඛ්‍යාලේඛන සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව |
| 21 | ඩබ්.ඒ.ආර්. මංගලිකා මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 මැයි 27 සිට 31 දක්වා තායිලන්තයේ පැවති ICP හා SNA හි ත්‍රෛමාසික ජතික ගිණුම් සම්පාදන කටයුතු IMF සංඛ්‍යාලේඛන සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව |
| 22 | ඩබ්.ඒ.එස්.පී. සෙනවිරත්න මයා<br>සංඛ්‍යාලේඛන සහකාර | 2013 මැයි 27 සිට 31 දක්වා තායිලන්තයේ පැවති ICP හා SNA හි ත්‍රෛමාසික ජතික ගිණුම් සම්පාදන කටයුතු IMF සංඛ්‍යාලේඛන සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව |
| 23 | එච්.කේ.ඩබ්.කේ.කේ. හිටිබන්ඩාර මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 මැයි 15 සිට ජූනි 04 දක්වා චීනයේ පැවති චීනයේ සමාජ හා ආර්ථික සංවර්ධනයේ මූලික පළපුරුද්ද පිළිබඳ සම්මන්ත්‍රණය |
| 24 | අයි.ආර්. බන්ඩාර මිය<br>අධ්‍යක්ෂ | 2013 අප්‍රේල් 29 සිට 30 දක්වා ස්විට්සර්ලන්තයේ පැවති ආබාධිතයින් පිළිබඳ විශේෂඥ රැස්වීම |
| 25 | කේ.එල්.සී.එස්. වීරසූරිය මයා<br>පද්ධති විශ්ලේශක/වැඩසටහන් සම්පාදක | 2013 ජූනි 25 සිට 27 දක්වා පිලිපීනයේ පැවති NADA4 මැනුම් ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ කලාපීය වැඩසටහන |
| 26 | පී.ඩී.ඩී. පීරිස් මයා<br>පද්ධති විශ්ලේශක/වැඩසටහන් සම්පාදක | 2013 ජූනි 25 සිට 27 දක්වා පිලිපීනයේ පැවති NADA4 මැනුම් ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ කලාපීය වැඩසටහන |
| 27 | යූ. මහේෂ්වරන් මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2013 ජූලි 08 සිට 10 දක්වා චීනයේ පැවති කර්මාන්ත සංඛ්‍යාලේඛන පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 28 | ඩී.එම්.එන්. බන්ඩාර මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 ජූලි 08 සිට 10 දක්වා චීනයේ පැවති කර්මාන්ත සංඛ්‍යාලේඛන පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 29 | ජී.එස්.උඩුවන මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 අගෝස්තු 05 සිට 09 දක්වා කොරියාවේ පැවති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාලේඛන දියුණු කිරීමට සම්පත් පිළිබඳ පළමු RAP කලාපීය පුහුණු වැඩමුළුව |

| | | |
|---|---|---|
| 30 | බී. බාලචන්ද්‍රන් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2013 ජූලි 22 සිට අගෝස්තු 02 දක්වා ජපානයේ පැවති තරුණයින් පිළිබඳ තේමාව විශ්ලේෂණය කරමින් ජනගහන සංගණන දත්ත සැලසුම් හා තීරණ ගැනීම සඳහා යොදා ගැනීම පිළිබඳ කලාපීය පුහුණුව |
| 31 | ඩී.සී.ඒ. ගුණවර්ධන මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2013 අගෝස්තු 13 සිට පිලිපීනයේ පැවති ජාතික ක්‍රියාත්මක කිරීමේ යොජිතායතනවල ප්‍රධානීන් සඳහා 2011 ආසියා හා පැසිපික් දත්ත නිකුත් කිරීම සඳහා ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන |
| 32 | සුසන්තා රණධීර මිය<br>අධ්‍යක්ෂ | 2013 අගෝස්තු 13 සිට පිලිපීනයේ පැවති ජාතික ක්‍රියාත්මක කිරීමේ යොජිතායතනවල ප්‍රධානීන් සඳහා 2011 ආසියා හා පැසිපික් දත්ත නිකුත් කිරීම සඳහා ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන |
| 33 | බී.ජී. කුමාරි ප්‍රේමලතා මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 ජූලි 29 සිට අගෝස්තු 04 දක්වා සිංගප්පූරුවේ පැවති රාජ්‍ය මූල්‍ය පිළිබඳව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම |
| 34 | ඩබ්.එච්.ඩී.සී.පී. විජේසූරිය මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 ඔක්තොම්බර් 07 සිට 10 දක්වා ඉන්දුනීසියාවේ පැවති වෙළඳ හා සංචාරක සංඛ්‍යාලේඛන පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය |
| 35 | එච්.එම්.එන්.කේ. හෙන්නායක මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 ඔක්තොම්බර් 07 සිට 10 දක්වා ඉන්දුනීසියාවේ පැවති වෙළඳ හා සංචාරක සංඛ්‍යාලේඛන පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය |
| 36 | එච්.ආර්.එල්.එස්. රණතුංග මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2013 ඔක්තොම්බර් 07 සිට 10 දක්වා ඉන්දුනීසියාවේ පැවති වෙළඳ හා සංචාරක සංඛ්‍යාලේඛන පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය |
| 37 | පී.එච්. වල්පිට මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 සැප්තැම්බර් 10 සිට 17 දක්වා ඉරානයේ පැවති කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන සඳහා කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාලේඛන නියැදි ක්‍රමය දියුණු කිරීමට සම්පත් ගොඩනැගීම පිළිබඳ දෙවන RAP කලාපීය වැඩමුළුව - නූතන භාවිතය නිරීක්ෂණය |
| 38 | ඩී.සී.ඒ. ගුණවර්ධන මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2013 ඔක්තොම්බර් 08 සිට 10 දක්වා තායිලන්තයේ පැවති ආසියා පැසිපික් කලාපීය පරිසර සඳහා තක්සේරු කිරීම හා ගණනය කිරීම - ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති සාදන්නන් හා කළමණාකරුවන් සඳහා වැඩමුළුව |
| 39 | එම්.ඩී.ටී. කුමාරි මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 ඔක්තොම්බර් 22 සිට 25 දක්වා ඉන්දියාවේ පැවති UIS දකුණු හා බටහිර ආසියා සංස්කෘතීන්වල සංඛ්‍යාලේඛන පුහුණු වැඩසටහන |
| 40 | ජේ.එස්.පී.එන්. ධර්මවර්ධන මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 ඔක්තොම්බර් 02 සිට 11 දක්වා ස්විස්ටර්ලන්තයේ ජිනීවා හි පැවැති කම්කරු සංඛ්‍යාලේඛනඥයින්ගේ 19 වන ජාත්‍යන්තර සම්මේලනය |
| 41 | ඩබ්.ඒ.ආර්.එල්.වැලිවිට මිය<br>පද්ධති පාලක | 2013 ඔක්තොම්බර් 21 සිට 25 දක්වා පිලිපීනයේ පැවති STATA භාවිතයෙන් සංඛ්‍යාලේඛන දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 42 | ආර්.කේ.පී. ජයතුංග මිය<br>පද්ධති පාලක | 2013 ඔක්තොම්බර් 21 සිට 25 දක්වා පිලිපීනයේ පැවති STATA භාවිතයෙන් සංඛ්‍යාලේඛන දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 43 | ඩී.පී.ඒ. දිසානායක මයා<br>පද්ධති පාලක | 2013 ඔක්තොම්බර් 21 සිට 25 දක්වා පිලිපීනයේ පැවති STATA භාවිතයෙන් සංඛ්‍යාලේඛන දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහන |

| | | |
|---|---|---|
| 44 | ජී.ඩබ්.සී.කේ.කේ. සුමනසිරි මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 ඔක්තොම්බර් 21 සිට 25 දක්වා පිලිපීනයේ පැවති STATA භාවිතයෙන් සංඛ්‍යාලේඛන දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 45 | ඒ.ඩබ්.එස්.ඩබ්. පෙරේරා මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 ඔක්තොම්බර් 21 සිට 25 දක්වා පිලිපීනයේ පැවති STATA භාවිතයෙන් සංඛ්‍යාලේඛන දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 46 | ඩී.එම්.සමරවික්‍රම මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 ඔක්තොම්බර් 21 සිට 25 දක්වා පිලිපීනයේ පැවති STATA භාවිතයෙන් සංඛ්‍යාලේඛන දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 47 | එස්.එන්.පී. වනමලී මිය<br>සංඛ්‍යාලේඛන සහකාර | 2013 නොවැම්බර් 11 දින සිට දෙසැම්බර් 20 දක්වා ඉන්දියාවේ පැවති "කණ්ඩායම් සංවර්ධන විධායකයින් " පිළිබඳ ජාත්‍යන්තර වෙළඳ වැඩසටහන |
| 48 | ඩබ්.එස්.ඩී. ජයසුන්දර මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 නොවැම්බර් 11 දින සිට දෙසැම්බර් 20 දක්වා ඉන්දියාවේ පැවති "කණ්ඩායම් සංවර්ධන විධායකයින් " පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන |
| 49 | ඒ.ජී.එස්.පී.කේ. අඹන්පිටිය මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 නොවැම්බර් 11 දින සිට දෙසැම්බර් 20 දක්වා ඉන්දියාවේ පැවති "කණ්ඩායම් සංවර්ධන විධායකයින් " පිළිබඳ ජාත්‍යන්තර වෙළඳ වැඩසටහන |
| 50 | එම්.එල්.ඒ.පී. ගුණසේකර මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 සැප්තැම්බර් 16 සිට 18 දක්වා තායිලන්තයේ පැවති සෞඛ්‍ය කළමණාකරන තොරතුරු පද්ධතිය නිරීක්ෂණය කිරීමේ අධ්‍යයන චාරිකාව |
| 51 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2013 ඔක්තොම්බර් 24 සිට 26 දක්වා චීනයේ පැවති නිල සංඛ්‍යාලේඛන නවීකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය |
| 52 | එස්. ජයගෞරී මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2013 ඔක්තොම්බර් 14 සිට 18 දක්වා ජාතික ගිණුම් පද්ධති පිළිබඳ 6 වන කලාපීය පුහුණු පාඨමාලාව |
| 53 | සෙනරත් දයා රාජපක්ෂ මයා<br>සංඛ්‍යාලේඛන සැලසුම්කරු | 2013 සැප්තැම්බර් 30 සිට ඔක්තොම්බර් 01 දක්වා ජපානයේ පැවති ආසියා හා පැසිපික් කලාපීය සහනදායි තත්වයක් ඇති කිරීමට ආපදා දත්ත දියුණු කිරීම පිළිබඳ විශේෂඥ කණ්ඩායම |
| 54 | ඩී.ඩී.ජී.ඒ. සෙනවිරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2013 නොවැම්බර් 04 සිට 05 දක්වා තායිලන්තයේ පැවති 02 වන කොටස සඳහා ස්ත්‍රී/පුරුෂ සමානතාවයේ ආරම්භක රැස්වීම හා සමාජගතකිරීම සඳහා සංඛ්‍යාලේඛන ධාරිතාව සංවර්ධනය |
| 55 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2013 නොවැම්බර් 01 සිට තායිලන්තයේ පැවති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාලේඛන වැඩි දියුණු කිරීම සඳහා ආසියා හා පැසිපික් කලාපයට ගෝලීය උපක්‍රමයක් පිළිබඳ කලාපීය මෙහෙයුම් කමිටු පළමු රැස්වීම |
| 56 | ආර්.එච්.එස්. අබේනායක මයා<br>අධ්‍යක්ෂ | 2013 නොවැම්බර් 19 සිට 22 දක්වා ජපානයේ පැවති ආසියා හා පැසිපික් කලාපය සඳහා සංඛ්‍යාලේඛන ආයතනයේ පාලන කවුන්සිලයේ නව වන සැසිවාරය |
| 57 | එච්.ඩබ්.එම්. ජයවීර මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2013 නොවැම්බර් 25 සිට 28 දක්වා කොරියාවේ පැවති යුරෝපා රටවල උසස් සංඛ්‍යාන ක්‍රම පිළිබඳ දැනුම, ආසියා හා ශාන්තිකර කලාපීය රටවල් සමඟ බෙදා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන |

| | | |
|---|---|---|
| 58 | සී. ප්‍රේමරත්න මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2013 නොවැම්බර් 04 සිට 06 දක්වා තායිලන්තයේ පැවති ආසියා පැසිපික් කලාපයේ සංවර්ධන රාමුව හා ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාලේඛන හා දර්ශක පිලිබඳ කලාපීය වැඩමුළුව |
| 59 | ඩබ්. ජිනදාස මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2013 ඔක්තොම්බර් 28 සිට ඔක්තොම්බර් 30 දක්වා මලයාසියාවේ පැවති 8 වන JODI පුහුණු වැඩමුළුව |
| 60 | කේ.ඒ.එස්. කොඩිකාර මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2013 නොවැම්බර් 04 සිට 05 දක්වා තායිලන්තයේ පැවති සමාජ අනුගතවීම හා ස්ත්‍රී පුරුෂ සමානත්වය පිළිබඳව සංඛ්‍යාලේඛන ධාරිතා සංවර්ධන වැඩමුළුව |
| 61 | කේ.කේ.සී. ශිරෝමලී මෙය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 දෙසැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති නිෂ්පාදනය හා ප්‍රධාන සංඛ්‍යාලේඛන භාවිතය පිළිබඳ දෙවන කලාපීය වැඩමුළුව |
| 62 | පී.එම්.පී. අනුර කුමාර මයා<br>අධ්‍යක්ෂ | 2013 දෙසැම්බර් 02 සිට 04 දක්වා ඉන්දියාවේ පැවති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාලේඛන දියුණු කිරීමට සම්පත් දියුණු කිරීම, කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන සඳහා නියැදි ක්‍රම පිළිබඳ තුන්වන RAP කලාපීය වැඩමුළුව |
| 63 | එස්. තනබාලසිංහම් මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2013 දෙසැම්බර් 09 සිට 11 දක්වා තායිලන්තයේ පැවති ආසියා හා පැසිපික් කලාපයේ පාරිසරික සංඛ්‍යාලේඛන දියුණු කිරීම සඳහා උපක්‍රම පිළබඳ විශේෂඥ කණ්ඩායම් රැස්වීම |
| 64 | ඩී.ඩී.ජී.ඒ. සෙනවිරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2013 දෙසැම්බර් 09 සිට 11 දක්වා ආසියා පැසිපික් හි සිවිල් ලියාපදිංචිය හා ප්‍රධාන සංඛ්‍යාලේඛන සඳහා කලාපීය මෙහෙයුම් කණ්ඩායම් වල පලමු රැස්වීම |

### 3.4 උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම්

**උසස් කිරීම්**

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 05 |
| කාර්යාල කාර්ය සහායක | 01 |

**පත් කිරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන සහකාර | 03 |
| සංවර්ධන නිලධාරි | 67 |
| දෙමළ මාධ්‍ය කේත ලිපිකරු | 14 |

**මුදාහැරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන නිලධාරී | 03 |
| සංඛ්‍යාලේඛන සහකාර | 03 |
| සංවර්ධන නිලධාරි | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| දත්ත සටහන් ක්‍රියාකරු/කේත ලිපිකරු | 05 |
| කාර්යාල කාර්ය සහායක | 01 |

**සේවය අතහැරයෑම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |

**විශ්‍රාමයෑම්**

| | |
|---|---|
| අධ්‍යක්ෂ | 03 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 04 |
| සංඛ්‍යාලේඛනඥ | 04 |
| ජ්‍යෙෂ්ඨ පද්ධති පාලක | 01 |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 05 |
| සහකාර අධ්‍යක්ෂ (තො.ස.තා.ස.) | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 03 |
| සහකාර දත්ත පාලක | 02 |
| යාන්ත්‍රික අංශයේ සේවක | 01 |
| රියදුරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 02 |

**ස්ථාන මාරු**

| | |
|---|---|
| ගණකාධිකාරි | 02 |
| සංඛ්‍යාලේඛන නිලධාරි | 35 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 22 |
| දත්ත සටහන් ක්‍රියාකරු/ක්ෂේත්‍ර ලිපිකරු රියදුරු | 02 |
| රියදුරු | 15 |
| කාර්යාල කාර්ය සහායක | 10 |

## 3.5 අභ්‍යන්තර විගණන කටයුතු

2013 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන වැඩ සටහන පිළියෙල කර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදි.දෙපාර්තමේන්තුවට අදාල ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ විගණන විමසුම් පිළිබඳව කාර්තු විගණන කළමනාකරණ රැස්වීමේදි සාකච්ජා වූ අතර, එම කරුණු මත වාර්තාව පිළියෙළ කොට අදාල අංශ වෙත යවන ලදි .

දෙපාර්තමේන්තුවේ අංශවල නිවාඩු සහ බැහැර යාමේ ලේඛන පවත්වා ගෙන යන ආකාරය පිළිබඳ සොයා බැලීම සඳහා අංශ කිහිපයක නියැදියක් තෝරා ගෙන ඉහත කරුණු පිළිබඳව විගණනය කරන ලදී. එහිදී හඳුනාගත් අඩුපාඩු සලකා බලා බැහැර යෑම සම්බන්ධ චක්‍රලේඛයක් නිකුත් කිරීමට කෙටුම්පතක් සකස් කර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) වෙත යොමු කරන ලදි.

වව්චර් පරීක්ෂා කිරීමේ කාර්යයට අමතරව ආයතන අංශයේ කාර්ය සාධන වාර්තා, කාර්ය මණ්ඩල ලිපි ගොනු සහ ආයතන පරිපාලනයට අදාල විෂයය කටයුතු පරීක්ෂා කර වාර්තා කරන ලදී.

## 4. මූල්‍ය වාර්තාව - 2013

2013 වර්ෂය සඳහා අදාල සීමාවන් යටතේ වන මුළු ඇස්තමේන්තුගත වියදම රු.1,650,471,129 (මිලියන 1,650.47) කි. මේ අතරින් රු. 637,500,000 (මිලියන 637.5) ක් පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු වන

අතර රු. 1,012,971,129 ක් (මිලියන 1,012.97) ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු වේ. "පුනරාවර්තන වියදම් 2013" වගුව අනුව සත්‍ය වශයෙන් දරන ලද පුනරාවර්තන වියදම රු. 632,400,029 (මිලියන 632.40) ක් වේ. "ප්‍රාග්ධන වියදම් 2013" වගුවෙහි දක්වා ඇති පරිදි සත්‍ය වශයෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. 996,108,136 (මිලියන 996.10) කි.

මෙම මුළු වියදම් අවශ්‍යතාවය එමෙන්ම පුද්ගලික පඩිනඩි හා වෙනත් පුනරාවර්තන වියදම් ආදී ලෙස වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත. ඉහත වර්ගකිරීම් යටතේ ඇස්තමේන්තුගත වියදම හා සත්‍ය වියදම අතර සුළු වෙනසක් දැකිය හැකි අතර ඊට හේතු පහත දැක්වේ.

- වවුචර ප්‍රමාද වී ඉදිරිපත් කිරීම
- නඩත්තු වියදම අඩුවීම

ප්‍රාග්ධන වියදම, සත්‍ය වියදම ඇස්තමේන්තුගත වියදම අතර වෙනස

- අළුත්වැඩියා වියදම් අවම වීම
- වවුචර ප්‍රමාද වී ඉදිරිපත් කිරීම

ශීර්ෂය : 252 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වැඩ සටහන : 01 මෙහෙයුම් වැඩ සටහන

ව්‍යාපෘතිය : පරිපාලනය සහ සංඛ්‍යානමය සේවා

**පුනරාවර්තන වියදම් 2013**

| ව්‍යාපෘතිය | වැය විෂයය | 2013 ඇස්තමේන්තුව (මුළු ශුද්ධ වෙන්කිරීම) රුපියල් | 2013 සත්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| 1 | 1. පුද්ගලික පඩිනඩි | 466,800,000 | 465,341,656 |
| | 2. වෙනත් පුනරාවර්තන වියදම් | 170,700,000 | 167,058,373 |
| | **එකතුව** | **637,500,000** | **632,400,029** |

**ප්‍රාග්ධන වියදම් 2013**

| ව්‍යාපෘතිය | වැය විෂයය | 2013 ඇස්තමේන්තුව (මුළුශුද්ධ වෙන්කිරීම) රුපියල් | 2013 සත්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| 1 | 1. මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම | 7,100,000 | 4,198,714 |
| | 2. මූලධන වත්කම්වල අත්පත් කර ගැනීම | 324,000,000 | 317,562,597 |
| | වෙනත් මූලධන වියදම් | 681,871,129 | 674,346,825 |
| | **එකතුව** | **1,012,971,129** | **996,108,136** |

**ර.නි.අ.බි. ගිණුම 25201 – 2013**

| | අනුමත සීමාව<br>රුපියල් | සත්‍ය සීමාව<br>රුපියල් |
|---|---|---|
| උපරිම හර සීමාව | 50,000,000 | 23,007,040 |
| උපරිම බැර සීමාව | 22,000,000 | 30,743,047 |
| හර ශේෂයේ උපරිම සීමාව | 215,000,000 | 132,251,858 |